# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1723/35 – 2011 සැප්තැම්බර් 16 වැනි සිකුරාදා – 2011.09.16

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ යොමු අංකය: අයිආර්/07/06/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03.

සහ

ඊකඩහේන වැවිලි (පුද්ගලික) සමාගම, ඊකඩහේන, කහදූව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා ඇමති ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, නො. 13/30 හි සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: අයිආර්/07/06/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03.

සහ

රැකඩහේන වැවිලි (පුද්ගලික) සමාගම, රැකඩහේන, කහදූව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

01. රැකඩහේන වැවිලි (පුද්ගලික) සමාගමේ කාර්ය මණ්ඩල සේවකයින් වශයෙන් සේවය කරනු ලබන ලංකා වතු සේවා සංගමයේ සාමාජිකත්වය දරන සේවකයින් සඳහා ක්‍රියාත්මකව පැවති වෛද්‍යාධාර ක්‍රමය අහෝසි කිරීමෙන් එම සේවකයින් භුක්ති විඳි වරප්‍රසාද අහිමිවූයේ ද එසේ වන්නේ නම් ඔවුනට හිමිවිය යුතු සහන මොනවාද යන්න හා

02. රැකඩහේන වැවිලි (පුද්ගලික) සමාගමේ තේ කම්හලේ සහ වතුයායේ සේවයේ නියුතු කාර්ය මණ්ඩල සේවකයින්ට ලබාදෙන වැටුප් හා දීමනාවලට වඩා වෙනස් වූ අඩුවූ වැටුප් එම කම්හලේ සහකාර කම්හල් නිලධාරි තනතුරට අයත් රාජකාරි කටයුතු වල සේවයේ යොදවා ඇති පී. ඒ. එස්. කුමාර, අජිත් නිශාන්ත විතානාච්චි සහ තුෂාර වන්නිආරච්චි යන සේවකයින්ට ලබාදීමෙන් හා 2009 වර්ෂයේ සිට කාර්ය මණ්ඩලයේ සේවකයින් කිහිපදෙනෙකුට පමණක් ප්‍රසාද දීමනා ලබානොදීමෙන් ඔවුනට යම් අසාධාරණයක් සිදුවී ඇද්ද? එසේ නම් ඔවුනට ලැබිය යුතු සහන මොනවාද හා කුමන ප්‍රමාණයකින්ද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 1404

---

මගේ යොමු අංකය: අයිආර්/10/64/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සෝමා විජේසූරිය මිය. ඇතුළු විශ්‍රාමික සේවකයින්, 34, මන්ත්‍රීමුල්ල පාර, අත්තිඩිය, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව, රොටුන්ඩා ගොඩනැගිල්ල, නො. 109, ගාලු පාර, කොළඹ 03.
02. සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා ඇමති ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

දෙහිවල, ගල්වල පාර, පැරකුම් මාවත, නො. 179/2 හි, ඒ. එන්. පී. එදිරිසිංහ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: අයිආර්/10/64/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සෝමා විජේසූරිය මිය. ඇතුළු විශ්‍රාමික සේවකයින්, 34, මන්ත්‍රීමුල්ල පාර, අත්තිඩිය, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව, රොටුන්ඩා ගොඩනැගිල්ල, නො. 109, ගාලු පාර, කොළඹ 03.
02. සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

1997 සිට 2002 කාලයේ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ සේවයේ සිට දැනට විශ්‍රාම ගොස් සිටින සෝමා විජේසූරිය මහත්මිය ඇතුළු A 5, A 6, A7 ශ්‍රේණිවල සේවකයින් සඳහා 1997 සිට 2002 වර්ෂවලට අදාලව පසුකාලීනව සිදු කල වැටුප් සංශෝධන ලබානොදීමෙන් ඔවුනට යම් අසාධාරණයක් සිදුවිණිද? එසේ වූයේ නම් ඒවා ලබාදෙන්නේ කුමන සේවායෝජකයන් විසින් කා සඳහා කුමන කාලයකට කොපමණ ප්‍රමාණයකින්ද යන්න වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 1405

---

මගේ අංකය: IR/22/50/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එම්. ජී. ජේ. ජී. ජී. නානායක්කාර මිය, අංක සී/ඊ-5/12, රන්පොකුණගම, නිට්ටඹුව.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් දෙහිවල, ඇතුළු වැන්ඩවර්ට් පෙදෙස, නො. 12හි, ඩබ්. ජී. ඩීන් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/50/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එම්. ජී. ජේ. ජී. ජී. නානායක්කාර මිය, අංක සී/ඊ-5/12, රන්පොකුණගම, නිට්ටඹුව.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ලබාදුන් පාලන සහකාර පත්වීම 1990.03.01 වන දිනට පෙරදාතම කරන මෙන් ද, පාලන නිලධාරි තනතුර 1994.03.01 දිනට පෙරදාතම කරන මෙන් හා ඒ අනුව හිඟ වැටුප් හා වැටුප් වර්ධක ගෙවන ලෙසට එම අධිකාරිය වෙතින් කරන ඉල්ලීම යුක්ති සහගත ද යන්න හා යුක්තිසහගත වන්නේ නම් එම්. ජී. ජේ. ජී. ජී. නානායක්කාර මහත්මියට ලැබිය යුතු සහනය කුමක්ද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 1406

---

මගේ අංකය: IR/10/104/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එස්. එම්. ඩී. ජයසුන්දර මිය, අංක 417, ශිරෝමණී මාවත, ගොඩිගමුව, මහරගම.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, 05 වන මහල, නිවාස ලේකම් ගොඩනැගිල්ල, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, නො. 570/බී/1හි පී. නවරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/104/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එස්. එම්. ඩී. ජයසුන්දර මිය, අංක 417, ශිරෝමණී මාවත, ගොඩිගමුව, මහරගම.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, 05 වන මහල, නිවාස ලේකම් ගොඩනැගිල්ල, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරන (මුදල්) තනතුර දරා 2009.12.21 දින විශ්‍රාම ගිය එස්. එම්. ඩී. ජයසුන්දර මහත්මියගේ සේවය විනය පරීක්ෂණයකින් පසුව 1995.07.29 දින සිට සේවය අවසන් කර ඇති බවත් කම්කරු විනිශ්චය සභා නියෝගයක් මත සේවය කඩවීමක් රහිතව වන්දියක් ලෙස වසර දෙකක වැටුපක් වන රු. 1,73,520.00 (රුපියල් එක්ලක්ෂ හැත්තෑ තුන්දාස් පන්සිය විස්ස)ක මුදලක් ද සමග 2004.06.15 දින සිට නැවත සේවයේ ද පිහිටුවා තිබේ. සේවය අහිමිවීමේ කාලය තුළ වැටුප හා දීමනා නොලැබීමෙන් ද උසස් වීම් සඳහා සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට අවස්ථාව නොලැබීමෙන් ද යම් අසාධාරණයක් ඇයට සිදුවිණි ද? එසේ නම් ලැබිය යුතු සහන මොනවාද? කුමන ප්‍රමාණයකින් ද?

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 1407